සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

சபரகமுவ மாகாண தல்வித் திணைக்களம்

Sabaragamuwa Provincial Department of Education

දෙවන වාර පරීක්ෂණය - 2018	11 ශ්‍රේණිය
Second Term Test – 2018	Grade 11

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - I	පැය එකයි
Information and Communication Technology - I	One hour

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 – 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි පිළිතුර තෝරන්න.

1 පහත ඒවායින් දත්තයක් ලෙස හැදින්විය හැක්කේ කුමක්ද

1. 2017 වර්ෂයේ අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාග ප්‍රතිඵල
2. නිවසක මාසික විදුලි බිල
3. එක් දින ක්‍රිකට් තරගයක ක්‍රීඩකයකු රැස් කල ඉහළම ලකුණ
4. පරිගණකයක දෘඩ තැටියේ ධාරිතාවය

2 පහත සදහන් රූප සටහන් අධ්‍යයනය කර ඒ හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

රූප සටහන 1

රූප සටහන 2

1. රූප සටහන 1 හි සඳහන් තීරු කේතය (Barcode) මගින් නිරූපිත වෙබ් අඩවියට ප්‍රවේශ විය හැකිය.
2. රූප සටහන 2 හි සඳහන් QR කේතය (QR code) මගින් නිරූපිත වෙබ් අඩවියට ප්‍රවේශ විය හැකිය.
3. රූප සටහන 1 හි සඳහන් QR කේතය (QR code) මගින් නිරූපිත වෙබ් අඩවියට ප්‍රවේශ විය හැකිය.
4. රූප සටහන 2 හි සඳහන් තීරු කේතය (Barcode) මගින් නිරූපිත වෙබ් අඩවියට ප්‍රවේශ විය හැකිය

3 පහත කුමන ප්‍රකාශය නාභිය (Hub) හා ස්විචය (Switch) සම්බන්ධයෙන් සත්‍ය වේද?

A. ස්විචයේ දත්ත සම්ප්‍රේෂණ වේගය නාභියේ දත්ත සම්ප්‍රේෂණ වේගයට වඩා වැඩිය.
B. නාභිය විසින් දත්ත සියළුම පරිගණක වෙත යවනු ලබයි.
C. ස්විචය දත්ත අදාල පරිගණක වෙත පමණක් යවනු ලබයි.
D. නාභිය ඒකපථ ක්‍රමයටද ස්විචය පූර්ණ ද්විපථ ක්‍රමයටද දත්ත සම්ප්‍රේෂණය කරයි.

01. A,B,C 02. A,B,D 03. B,C,D 04. A,C,D

4 පහත සදහන් දෑ අතුරින් දක්වනයක් (pointing device) නොවන්නේ කුමක්ද?

01. ප්‍රකාශ පෑන (light pen) 02. මෙහෙයුම් යටිය (joystick)
03. මූසිකය(mouse) 04. තීරුකේත කියවනය (barcode reader)

5 ප්‍රතිදාන උපක්‍රම සම්බන්ධයෙන් පහත දී ඇති වගන්ති අතුරෙන් කවරක් සත්‍ය වේද?

A. ගුණාත්මක බවින් ඉහළ මුද්‍රිත පිටපත් ලේසර් මුද්‍රණ යන්ත්‍ර මඟින් ලබා දේ.

B. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රවල රිසිට්පත් මුද්‍රණය සඳහා තීන්ත විහිදුම් මුද්‍රණ යන්ත්‍ර භාවිත කරයි.

C. කැතෝඩ කිරණ නල සංදර්ශකය විකිරණශීලී බවින් ඉහළ වේ.

01. A පමණි 02. B පමණි 03. A හා C පමණි 04. A,B,C සියල්ලම

6 ධාරිතාවය හා ප්‍ර වේශ වේගය ඉහළම ආවයන උපාංග දෙක පිළිවෙලින් දැක්වෙනුයේ,

01. චුම්භක පටිය , සසම්භාවී පිවිසුම් මතකය 02. වාරක මතකය , දෘඩ තැටිය

03. චුම්භක පටිය , මතක රෙජිස්තර 04. දෘඩ තැටිය , සංචිත මතකය

7 බ්ලූ -රේ (blue -ray) තැටියක දත්ත ගබඩා කිරීමේ ධාරිතාවය වන්නේ

01. 650-900 MB 02. 25-128 GB

03. 4.7-9.4 GB 04. 1.44 MB

8 පහත රූප සටහනේ සඳහන් කෙවෙනිය (port) හඳුන්වන නම වන්නේ



01. PS /2 port 02. HDMI port

03. RJ 45 port 04. Parallel port

9 නියමු නොවන මාධ්‍ය (unguided /wireless media) සඳහා උදාහරණයක් නොවන්නේ,

01. ගුවන් විදුලි තරංග (radio waves) 02. ක්ෂුද්‍ර තරංග (microwaves)

03. ප්‍රකාශ තන්තු (fiber optic cable) 04. අධෝරක්ත කිරණ (infrared)

10 පහත දක්වා ඇති ප්‍රකාශ අතරින් උපයෝගීතා මෘදුකාංග පිළිබද අසත්‍ය ප්‍රකාශය වන්නේ කුමක්ද?

1. උපයෝගීතා මෘදුකාංග යෙදවුම් මෘදුකාංග ගණයට අයත් වේ.
2. ප්‍රති වෛරස මෘදුකාංග හා උපස්ථ මෘදුකාංග උපයෝගිතා මෘදුකාංග ගණයට අයත් වේ.
3. උපයෝගීතා මෘදුකාංග මගින් මෙහෙයුම් පද්ධතියේ කාර්යක්ෂමතාවය වැඩි කරයි.
4. උපයෝගිතා මෘදුකාංග පරිගණකයේ සම්පත් කළමනාකරණය කරයි.

11 පරිගණකයක් බූට් (boot) කිරීමේදී එය භාරව ඇති ප්‍රධාන වැඩසටහනේ නම කුමක්ද?

1. CPU
2. RAM
3. Bootstrap loader
4. CMOS

12 පහත A හා B රූප වලින් දැක්වෙන ගොනු ප්‍රවේශ ආකාර දෙක පිළිවෙලින් නම් කර ඇත්තේ,



A



B

01. සසම්භාවී ප්‍රවේශය, සෘජු ප්‍රවේශය 02. සසම්භාවී ප්‍රවේශය,අනුක්‍රමික ප්‍රවේශය

03. සෘජු ප්‍රවේශය,සසම්භාවී ප්‍රවේශය 04. අනුක්‍රමික ප්‍රවේශය , සසම්භාවී ප්‍රවේශය

13 පහත සඳහන් කුමක් ටෙරා බයිට් 2 ට (2TB) ආසන්න ලෙස තුල්‍ය වේද?

01. 2^{10}TB 02. 2 X2^{20} MB 03. 2X2^{21} KB 04. 2^{10}X2^{10} MB

14 ෂඩ් දශමය ACE පරිගණක මතකය තුළ නිරූපනය කිරීමට අවශ්‍ය අවම බිටු ගණන වන්නේ.

01. 4 02. 8 03. 12 04. 9

15 පහත දී ඇති සත්‍යතා වගුව නිරූපනය කරන තාර්කික පරිපථය කුමක්ද?

X	Y	F
0	0	1
0	1	0
1	0	0
1	1	0

(1). 

(3) 

(2). 

(4). 

16 A=10 , B=15, C= 20 නම් පහත X හා Y තාර්කික ප්‍රකාශ සලකන්න.

X: (A>B) OR (C>B) Y: NOT(A=B)

X හා Y ප්‍රකාශනවල ප්‍රතිඵල පිළිවෙලින් දැක්වෙන්නේ පහත සඳහන් කවරකින්ද?

01. සත්‍ය , අසත්‍ය 02. සත්‍ය , සත්‍ය 03. අසත්‍ය , සත්‍ය 04. අසත්‍ය , අසත්‍ය

17 වදන් සැකසුම් මෘදුකාංග පිළිබඳ පහත වගන්ති සලකා බලන්න.

A. Microsoft word 2013 සංස්කරණයෙ ගොනු දිගුව .docx ය.
B. Libere Office writer හි ගොනු දිගුව .odt ය.
C. Microsoft word 2013 හා Libere Office writer වලින් ලියන ලද ලේඛනයක ආරක්ෂාවට මුර පද (password) යෙදිය හැකිය.

මින් නැවැරදි ප්‍රකාශ වන්නේ

01. A පමණි 02. B පමණි 03. A හා C පමණි 04. A B C සියල්ලම

18 පහත A , B, C තුළින් නිරූපනය වන්නේ,



1. අලුප් කිරීම(Redo) සුරැකීම (Save) ලොප් කිරීම(Undo)
2. සුරැකීම (Save) ලොප් කිරීම (Undo)අලුප් කිරීම (Redo)
3. ලොප් කිරීම(Undo) පිළිවෙලකට සැකසීම (Sort) අලුප් කිරීම(Redo)
4. ලොප් කිරීම(Undo) සුරැකීම (Save) අලුප් කිරීම(Redo)

19 වදන් සැකසුම් මෘදුකාංගයක නව ලේඛනයක් ලබා ගැනීමට අදාළ කෙටි යතුර වනුයේ,

01. Ctrl+N 02. Ctrl+O 03. Ctrl+A 04. Ctrl+S

20 පහත කෝෂ ලිපින අතුරෙන් නිවැරදි තීරු නිරපේක්ෂ (column absolute) කෝෂ ලිපිනය ඇති පිළිතුර වන්නේ

01. H$23 02. H23$ 03. H23$ 04. $H23

21 දී ඇති පැතුරුම් පතෙහි කෝෂ වල (Cell) ඇති අගයන් වල සාමාන්‍ය ගණනය කිරීම සඳහා පහත සූත්‍ර භාවිතා කර ඇත.

	M	N
1	65	
2	26	
3	30	
4		15
5		12

P=Average(M1:M3,N4:N5)
Q=(M1:M3+N4:N5)/5
R=Average(M1+M2+M3+N4+N5)
S=(M1+M2+M3+N4+N5)/5

ඉහත සූත්‍ර වලින් නිවැරදි වන්නේ

01. Q හා R පමණි 02. P හා R පමණි 03. P හා S පමණි 04. සියල්ලම

22 විද්‍යුත් පැතුරුම් පතක (spread sheets) කෝෂයක් තුල "#Value" ලෙසින් දර්ශනය වී ඇත්නම් එමගින් නිරූපනය කරනුයේ

1. ඇතුලත් කල සූත්‍රය දෝෂ සහිත බව
2. දත්ත ඇතුලත් කිරීමට ප්‍රමාණවත් තරම් ඉඩක් කෝෂය තුල නොමැති බව
3. සංඛ්‍යාවක් 0 න් බෙදා ඇති බව
4. ඇතුලත් කල නමක් හෝ අගයක් හදුනා ගත නොහැකි බව

23 පහත විද්‍යුත් පැතුරුම්පතෙහි A1 හි =B2/B1*C3-B1^C3+A3 යන සමීකරණය ඇතුලත් කල විට ලැබෙන පිළිතුර වන්නේ

01. 12
02. 09
03. 06
04. 03

	A	B	C
1		2	
2		8	
3	5		3

24 වලාකුළු පරිගණක සංකල්පය සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ සලකන්න.

A. නොකඩවා පවතින අන්තර්ජාල පහසුකම් අවශ්‍ය වීම.
B. මෘදුකාංග සඳහා යන වියදම වැඩි වීම හා මෘදුකාංග යාවත්කාලීන කරගැනීමේ අපහසුතාවය
C. සියළු පරිගණක ජාල හා ජංගම උපකරණ රැහැන් රහිත අන්තර්ජාල සම්බන්ධතා ඔස්සේ ඕනෑම වේලාවක ඕනෑම ස්ථානයක සිට තොරතුරු ලබා ගැනීමට හා තැම්පත් කිරීමට පහසුකම් ලැබීම.
D. නඩත්තු ගැටළු අවමවීම හා කාර්ය සාධනය දියුණු වීම.

ඉහත පිළිතුරු අතරින් සත්‍ය ප්‍රකාශ/ප්‍රකාශය වන්නේ,

01. A,B පමණි 02. A,B,C පමණි. 03. A,C,D පමණි 04. ඉහත සියල්ලම

25 සමර්පණ මෘදුකාංගයක(Presentation Software) කදා දැක්මක් (Slide show) මුල සිට ආරම්භ කිරීම සඳහා මෘදුකාංගයේ ඇති පහත දැක්වෙන කුමන නිරූපකය(Icon)භාවිත කරයිද?

01.
02.
03.
04.

26 සමර්පණයක (Slide show) කදා (Slide) අතර හුවමාරුව සජීවීකරණය සඳහා භාවිතා කෙරෙනුයේ මින් කුමක්ද?

1. කදා සංක්‍රමණය Slide Transition
2. සජීවිකරණ ප්‍රතිබිම්බය Animation Objects
3. ජීවිකරණ ක්‍රමය Animation Scheme
4. කදා සැකසුම Slide Design

27 දත්ත සමුදාය කළමනාකරණයේදී වගු දෙකක් අතර සම්බන්ධතා ගොඩනැගීම සඳහා වගු දෙක අතර තිබියයුතු ලක්ෂණයක් වන්නේ

1. වගු දෙකෙහිම කිසිම ක්ෂේත්‍රයක් සමාන නොවිය යුතුය
2. වගු දෙකෙහි එක් ක්ෂේත්‍රයක් හෝ සමාන විය යුතුය
3. වගු දෙකෙහි සියලු ක්ෂේත්‍රයන් අනිවාර්යයෙන් සමාන විය යුතුය
4. වගු දෙකෙහි තිබිය යුතු ක්ෂේත්‍ර ගණන අනිවාර්යෙන්ම සමාන විය යුතුය.

28 පහත දී ඇති වගු ඇසුරින් පිළිතුර සපයන්න

Office Table	කාර්යාල වගුව	
Off _ID	Off_name	Dept _ID
R001	Mr:Herath	DEP01
R002	Mr:Kumara	DEP02
R003	Ms: ranjani	DEP03

Visitors Table	ආගන්තුක වගුව	
Visitor _ID	Visitor_name	Off_ID
V18630	N perera	R001
V18631	A.M.K Malik	R001
V18632	S.A Chathura	R004
V18632	P.A Chathura	R002

මෙම වගු දෙකෙහි කුමන ක්ෂේත්‍රය දත්ත පාදකයෙහි ආගන්තුක යතුරක් (foreign Key) සඳහා උදාහරණයක් වේද?

01. කාර්යාල වගුවෙහි Off_ID
02. ආගන්තුක වගුවෙහි Off_ID
03. ආගන්තුක වගුවෙහි Visitor_ID
04. කාර්යාල වගුවෙහි Dept _ID

29 පහත ලූපය සිදුකරන පුනර්කරණ වාර ගණන වන්නේ,

```
S := 10;
Repeat
S := S +5;
Writeln(S);
Until S > 30 ;
```

01. 1 02. 2 03. 4 04. 5

30 පහත සඳහන් පැස්කල් ප්‍රකාශයෙහි ප්‍රතිදානය විස්තර කරන වගන්තිය තෝරන්න.

Writeln(X);

1. X විචල්‍යයේ අගය වර්තමාන ප්‍රතිදාන පේළිය මත ලියා කර්සරය ඊලඟ පේළියේ මුල් ස්ථානය වෙත ගෙන යන්න .
2. X විචල්‍යයේ අගය වර්තමාන ප්‍රතිදාන පේළිය මත ලියා කර්සරය එම පේළියේම ඊලඟ ස්ථානය වෙත ගෙන යන්න.
3. X විචල්‍යයේ අගය වර්තමාන ප්‍රතිදාන පේළිය මත ලියා කර්සරය එම පේළියේ මුල් ස්ථානය වෙත ගෙන යන්න.
4. කර්සරය ඊලඟ නව පේළියේ වෙත ගෙන ගොස් X විචල්‍යයේ අගය නව පේළිය මත ලිවීම

31 P යන විචල්‍යයෙහි මූලික අගය 2 නම්, පහත සඳහන් ලූපය ක්‍රියාත්මක වීමෙන් අනතුරුව P විචල්‍යයෙහි අගය වන්නේ මින් කුමක්ද?

```
for count:= 1 to 4 do
p:= p * count
```

01. 1 02. 10 03. 24 04. 48

32 (KMV:array[1..10] of string;) යන Pascal ක්‍රමලේඛ විධානය මඟින් නිර්මාණය වන අරාව (array) සම්බන්ධයෙන් **වැරදි ප්‍රකාශය** වන්නේ

1. අයිතම 10 ක් ගබඩාකලහැකි අරාවක් නිර්මාණය වේ.
2. මෙහි සංඛ්‍යාත්මක දත්ත 10ක් ගබඩා කල හැකිය.
3. අරාවේ අයිතම වලට 0 සිට 9 දක්වා අංක(index) වලින් ප්‍රවේශ විය හැක.
4. අරාවේ අයිතම 5ක පමණක් වුවද දත්ත ගබඩා කිරීමට භාවිතා කල හැකිය.

33 **Program abc; Var x,y:integer; begin x:=1; y:=x+10; if y>10 then write(y); readln; end.**

ඉහත දැක්වෙන එක් පේලියකට ලියා ඇති විධාන සමූහය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. එය ක්‍රමලේඛයක අසම්පූර්ණ කොටසකි.
2. එහි අත්‍යවශ්‍ය කොටස් නොමැති නිසා සම්පාදනය(Compile) කල නොහැක.
3. ක්‍රමලේඛය කාරක රීති උල්ලංගනය කරමින් ලියා ඇති නිසා සම්පාදනය(Compile) කල නොහැක.
4. එය සම්පූර්ණය, ක්‍රියාත්මක කල හැකි ක්‍රමලේඛයකි.

34 පහත දැක්වෙන පැස්කල් ක්‍රමලේඛය සලකන්න.

```
Program repetition ( input, output);
Var a , b : integer;
Begin
      a := 1;
      b := 0 ;
      Repeat
            a := a + 1 ;
            b := b + 1 ;
            write  ( a + b) ;
      Until a>5 ;
End.
```

ඉහත ක්‍රමලේඛය ක්‍රියාත්මක වු පසු ලබා දෙන ප්‍රතිදානය කුමක්ද?

01. 357911 02. 3,5,7,9,11 03. 3,5,7,9 04.
3
5
7
9
11

35 පරිගණක පාදක තොරතුරු පද්ධතියක් පිහිටුවීමේදී (deployment of the system) පද්ධතියේ කුඩා පරිමාණ ක්ෂේත්‍රයක මුලින්ම ස්ථාපනය කිරීම අයත් වන්නේ පද්ධති පිහිටුවීමේ කුමන ක්‍රමයටද?

1. සෘජු පිහිටුවීම (Direct deployment)
2. සමාන්තර ව පිහිටුවීම (parallel deployment)
3. නියමුමය පිහිටුවීම(pilot deployment)
4. අදියරමය පිහිටුවීම(phase deployment)

36 IP ලිපින සම්බන්ධව සාවද්‍ය ප්‍රකාශය වන්නේ

1. IP ලිපිනය අන්තර්ජාලයේ ඇති සෑම පරිගණකයක්ම අනන්‍යව හඳුනා ගැනීමට භාවිතා කරයි.
2. එකම IPලිපිනයක් ජාලයක් තුළ පවතින පරිගණක කිහිපයකට තිබිය හැක
3. IP ලිපින අන්තර්ජාලයේ සේවා සපයන ආයතන විසින් ලබා දේ.
4. IP ලිපින දශම තිත් වලින් වෙන් කරන ලද 0- 255 දක්වා වූ අගයන් හතරකින් සමන්විත වේ

37 වලංගු IP ලිපිනයක් නොවන්නේ (IPv4)

1. 172.64.89.25
2. 255.255.255.1
3. 12.255.255.1
4. 225.256.200.20

38 URL යනු,

1. Uniform Resource Locator
2. Universal Resource Locator
3. Uninterrupted resource Locator
4. Uniform Regional Locator

39 වලාකුළු පරිගණක භාවිතයේ ඇති වාසියක් නොවන්නේ,

1. මෘදුකාංග ක්ෂණිකව යාවත්කාලීන කල හැකි වීම
2. මෘදුකාංග සඳහා යන වියදම අඩු වීම.
3. නඩත්තු ගැටලු අවම වීම.
4. නොකඩවා අන්තර්ජාල පහසුකම් තිබිය යුතු වීම.

40 අමල් යැවීමට සකසමින් සිටි විද්‍යුත් තැපැල් ලිපියක් සම්පූර්ණ කර ගැනීමට පෙර වැසී ගියේය. මෙය තිබිය හැකි ෆෝල්ඩරය වනුයේ

01. Inbox 02. Out box 03. draft 04. trash

✠✠

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Sabaragamuwa Provincial Department of Education

දෙවන වාර පරීක්ෂණය - 2018	11 ශ්‍රේණිය
Second Term Test – 2018	**Grade 11**

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය II	පැය දෙකයි
Information and Communication Technology II	**Two hours**

- **පළමු වන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.**
- **පළමු වන ප්‍රශ්නයට ලකුණු 20ක් ද අනෙකුත් ප්‍රශ්න වලට ලකුණු 10 බැගින් ද හිමි වේ.**

01.

1. I. 253_8 සංඛ්‍යාවට තුල්‍ය වන ද්වීමය සංඛ්‍යාව සොයන්න.

   I I. 10101100_2 තුල්‍ය වන ෂඩ් දශමය සංඛ්‍යාව සොයන්න.

2. I. ඉ - රාජ්‍ය යෙදවුම් 2 ක් ලියා දක්වන්න.

   I I. වෛද්‍ය ක්ෂේත්‍රයේ තොරතුරු තාක්ෂණ යෙදවුම් 2 ක් ලියන්න.

3. 

ඉහත පරිපථයේ ප්‍රතිදානය (Q) සඳහා බූලියානු ප්‍රකාශනය ගොඩනගන්න.

4. පහත ලේබල සඳහා උදාහරණ වරහන් තුළින් තෝරා ලියන්න.

A . වසම් නාමය

B . ඒකාකාර සම්පත් නිශ්චායකය (URL)

C . IP ලිපිනය

D . නියමාවලිය

(SMTP, 192.168.1.1, doenets.lk, http://www.edupub.lk)

5. අංකිත ග්‍රාපිකයක මූලිකාංග 3 ක් නම් කරන්න.

6. වලාකුළු පරිගණක මගින් ඉටුකරන සේවා 2 ක් ලියන්න.

7. පහත දී ඇති ලේඛනය වදන් සැකසුම් මෘදුකාංගය භාවිතයෙන් සකස් කර ඇත.

හැඩසව් කිරීමට පෙර	හැඩසව් කිරීමට පසු
Producing Antibiotics Chemicals produced in the body of a microbe to destroy or sabotage another micro-organism are known as antibiotics. Fungi and bacteria are used to produce antibiotics. Antibiotics can kill bacteria and fungi but they do not fight against infections caused by viruses. Although, antibiotics are not much harmful to human they can cause side effects if used without medical advice. penicillin amoxicillin tetracycline erythromycin are used against bacterial infections while Griseofulvin is used against fungi infections.	**Producing Antibiotics** 1 **Chemicals produced in the body of a microbe to destroy or sabotage another micro-organism are known as antibiotics. Fungi and bacteria are used to produce antibiotics.** 2 Antibiotics can <u>kill bacteria and fungi</u> but they do not fight against infections caused by viruses. Although, antibiotics are not much harmful to human they can cause side effects if used without medical advice. 3 ❖ PENICILLIN ❖ AMOXICILLIN 4 ❖ TETRACYCLINE ❖ ERYTHROMYCIN are used against bacterial infections while Griseofulvin is used against fungi infections.



අංක 1 සිට 4 දක්වා ඇති හැඩසව් ගැන්වීමේ කාර්යයට භාවිතා කරන ලද මෙවලම / මෙවලම් හඳුනාගෙන හැඩසව් ගැන්වීමේ කාර්යයට අදාල අංකය සහ අදාල මෙවලම් ලේබල/ ලේබලය ඔබගේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

සැ. යු- අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි මෙවලම් දක්වා ඇති විට ලකුණු නොලැබේ

8. program whileloop;

```
var
        number:interger;
begin
         number :=1;
         while number <=10 do
           begin
           writeln (number);
           number = number + 1;
           end;


end;
```

ඉහත පැස්කල් කේතයට අදාල ප්‍රතිදානය ලියා දක්වන්න

9. පහත දී ඇති A වගුව සහ B වගුව ඔබගේ පිළිතුරු පත්‍රයට පිටපත් කර ගෙන A සහ B ගේ ගැලපෙන අයිතම යා කරන්න

A	B
යෙදවුම් මෘදුකාංග	පුණර්කරණ වෘද්ධි
භාෂා පරිවර්තක	GIMP
මෙහෙයුම් පද්ධති	අර්ථවින්‍යාසක
පද්ධති සංවර්ධක ආකෘති	MAC

10. පහත පෙන්වා දී ඇත්තේ රූප සංස්කාරක මෘදුකාංගයක මෙවලම් පෙට්ටියේ රූප සටහනකි. A සිට D දක්වා මෙවලම් වලින් ඉටුකරණ කාර්යයන් ලියා දක්වන්න



02.



1. A,B,C නම් කරන්න. ඒවා සඳහා උදාහරණ 1 බැගින් සපයන්න.
2. මෙහෙයුම් පද්ධතියක් මගින් ඉටු කරන උපයෝගීතා වැඩසටහන් 3 ක් නම් කරන්න
3. මෙහෙයුම් පද්ධතියේ ක්‍රියාකාරීත්වය අනුව මෙහෙයුම් පද්ධතිය වර්ගීකරණය කර ලියන්න. උදාහරණ 1 බැගින් සපයන්න.
4. මෙහෙයුම් පද්ධතිය ගොනු කළමණාකරනයේදී සිදුකරන කාර්යය 5 ක් ලියා දක්වන්න.

03.

උ/පෙළ සිසුන් ඇතුලත් කර ගැනීම 2014-2017

ශ්‍රී සුමන විද්‍යාලය

	A	B	C	D	E	F	G
1	**Section**	**2014**	**2015**	**2016**	**2017**	**Total**	**Avarage**
2	Art	32	38	49	69		
3	Commers	28	33	42	51		
4	Science	23	28	29	35		
5							
6							
7							

1. 2014-2017 දක්වා කලා අංශයට ඇතුලත් වූ මුළු සිසුන් සංඛ්‍යාව සෙවීමට =function(cell 1,cell 2) ආකාරයේ සූත්‍රයක් F2 කෝෂයේ ලියනු ලැබේ. function,cell 1,cell 2 සඳහා අදාල පද ලියා දක්වන්න.
2. G2 කෝෂය සඳහා ප්‍රකාශනය ලියා දක්වන්න.
3. F2 කෝෂයේ ඇති සූත්‍ර F4 දක්වා පිටපත් කිරීමට අදාල පියවර ලියා දක්වන්න.
4. මෙම දත්ත නිරූපණය සඳහා සුදුසු ප්‍රස්ථාර වර්ගයක් යෝජනා කරන්න.

04. Products

Product_ID	Product_Name	Price
P001	T.V	32,000.00
P002	Radio	18,000.00
P003	Video Player	23,000.00

Sales

Customer_ID	Product_ID	Qty_Sold
001	P001	1
002	P002	2
001	P001	1

Customer

Customer_ID	Customer_Name	City
001	Mr.Gurnarathna	Rathnapura
002	Mrs.Samarawera	Rathnapura
003	Ms.Gamage	Rathnapura

01. ප්‍රාථමික යතුරු 02 ක් එයට අදාල වගුව සමග ලියන්න.

02. Forieng key 01 ක් එයට අදාල වගුව සමග ලියන්න.

03. Products වගුව සහ Sales වගුව අතර සම්බන්ධතාව කුමක්ද?

04. Mr.Gunarathna විසින් TV 2 ක් මිල දී ගෙන ඇත. එසේ නම් යාවත්කාලීන කිරීමට අවශ්‍ය වන්නේ කුමන වගුවේ කුමන ක්ෂේත්‍රයද? එලෙස යාවත්කාලීන කරන ලද රෙකෝඩය ද නැවත ලියන්න.

05. කළමණාකරන තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීමට ABC ආයතනයට අවශ්‍ය වී තිබේ. නව පද්ධතිය සංවර්ධනය කිරීමට පෙර පවතින පද්ධතිය හා නව පද්ධතිය පිළිබඳ පූර්ණ විමසා බැලීමක් සිදුකෙරේ.

01. පද්ධතියේ අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා භාවිතා කළ හැකි ක්‍රම 5 ක් ලියන්න.

02. නව පද්ධතිය සැලසුම් කරණයේ දී කරනු ලබන කාර්යයන් 3 ක් ලියන්න.

03. පද්ධතිය සංවර්ධනය කිරීමෙන් පසු පද්ධතිය පිහිටුවීමේ දී සමාන්තර පිහිටුවීමේ ක්‍රමය යොදා ගැනීමට යෝජනා කරයි. එම ක්‍රමය භාවිත කිරීමෙන් ලැබෙන වාසි 2 ක් ලියන්න.

04. පද්ධතියක් නඩත්තු කිරීමට අවශ්‍ය වන්නේ ඇයි? පිළිතුර කෙටියෙන් පැහැදිලි කරන්න.

06. අන්තර්ජාලයේ මෙහෙයුම් සිදුකිරීමේදී පහත සඳහන් ඒවායේ කාර්යයන් ලියන්න.

1. I. වෙබ් අතිරික්සුව

   II. (DNS) වසම් නාම සේවාදායක

   III. වෙබ් සර්වර්

IV. (File Transfer Protocol) ගොනු හුවමාරු නාමාවලිය.

2. පාසලේ පරිගණක විද්‍යාගාරයේ පරිගණක ජාලකරණය සිදු කිරීමට යෝජනා කරන අතරම අන්තර්ජාල සම්බන්ධතාවක් ලබා ගැනීමට යෝජනා කරයි.

I. අන්තර්ජාල සම්බන්ධතාවක් ලබාගැනීමට සපුරාලිය යුතු අවශ්‍යතා 03 ක් ලියන්න.

II. පරිගණක විද්‍යාගාරය තුළ දත්ත සන්නිවේදනය සඳහා සුදුසු නියමු මාධ්‍යයක් සහ ජාලය සකස් කිරීමට සුදුසු ජාල ස්ථලකයක් යෝජනා කරන්න. හේතු දක්වන්න.

III. අන්තර්ජාලයට පිවිසීමේදී ගිනි පවුරේ කාර්යය විස්තර කරන්න.

07.

1.



ඉහත ගැලීම් සටහන සඳහා ව්‍යාජ කේතය ලියා දක්වන්න.

2. XYZ වෙළඳ ආයතනයේ නියෝජිතයෙකුගේ මාසික විකුණුම් ප්‍රමාණය මත වට්ටමක් ලබා දී මාසික වේතනය ගණනය කරනු ලබයි.

වට්ටම

- විකුණුම් ප්‍රමාණය රු.30,000/- ඉක්මවා ඇති විට 30% ක්ද
- විකුණුම් ප්‍රමාණය රු.30,000/- වඩා අඩු නම් 5% ක් ද වේ.

Final Salary - FS

Discount - D

Sales Rate - SR



A – F දක්වා හිස්තැන්වලට සුදුසු වචන යොදන්න

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

11 ශ්‍රේණිය

ICT II පිළිතුරු

01. ප්‍රශ්ණයේ කොටසකට ලකුණු 02 බැගින් පළමු වන ප්‍රශ්නයට ලකුණු 20කි.

1. I. $010\ 101\ 011_2$.

   I I. AC_{16}.

2. I. G_2C, G_2B, G_2G, G_2E

   I I. CAT, MRI, ECG, CSM ,EEG,……..

3. $(A+B^1)^1$. (BC)

4. A . doenets.lk B . http://www.edupub.lk

   C . 192.168.1.1 D . SMTP

5. ප්‍රමාණය , පික්සල්, විභේදනය, වර්ණය.

6. යටිතල පහසුකම් සේවාවක් ලෙස

   සංවර්ධන පරිසර සේවාවක් ලෙස

   මෘදුකාංග සේවාවක් ලෙස

7. 1 - F,H 3 - C

   2 - A,I 4 – J,H

8. 1,2,3,4,5,6,7,8,9,10

9.

A	B
යෙදවුම් මෘදුකාංග	GIMP
භාෂා පරිවර්තක	අර්ථවින්‍යාසක
මෙහෙයුම් පද්ධති	MAC
පද්ධති සංවර්ධක ආකෘති	පුණර්කරණ වෘද්ධි

10. A- fuzzy tool - එකම වර්ණයෙන් යුතු වූ එකට සම්බන්ධ වූ කොටස් තෝරා ගැනීම

B – Crop - ග්‍රාපිකය අවශ්‍ය ආකාරයට කප්පාදු කිරීම

C – Blend - තෝරාගත් කොටසට වර්ණ සම්මිශ්‍රණයක් යෙදීම

D – Align - ග්‍රාපිකය එක එල්ල කිරීමට

එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 10 බැගින් හිමි වේ.

02.

1. A – දෘඩාංග B – පද්ධති මෘදුකාංග C – යෙදවුම් මෘදුකාංග

2.

- උපස්ථ මෘදුකාංග - ගොනු පිටපත් කිරීමට හා දෘඩතැටිවල උපස්ථ ලබා ගැනීමට
- තැටි සුපරීක්ෂනය- - තැටිවල දෝෂ සහිත ප්‍රදේශ පරීක්ෂා කිරීමේ මෘදුකාංග
- තැටි ප්‍රතිභාගීකරණය - තැටියේ නිදහස්ව පවතින කුඩා ප්‍රදේශ එක්කර විශාල නිදහස් ප්‍රදේශයක් සෑදීමෙන් තැටිය සංවිධානය කිරීම.
- ගොනු/දත්ත සංකෝචනය - වැඩි ආචයන ධාරිතාවක් සහිත ගොනු සංකෝචනය කර අඩු ධාරිතාවයක් සහිත ගොනු බවට පරිවර්තනය කිරීම
- පද්ධති දෝෂ නිශ්චය කිරීමේ මෙවලම්- පරිගණකයක හෝ පරිගණක ජාලයක ඇති මෘදුකාංග හා දෘඩාංග වල දෝෂ හඳුනාගැනීම.

පිළිතුර අනුව ලකුණු ලබාදෙන්න.

3. ඒක පරිශිලක - MS DOS

බහු පරිශිලක - Linux , Wins

බහු කාර්ය - MS Win XP ,MS Win 8 ,Win 10

තත්ව කාල - ATM,

4 ධාවක තුළ පවතින ගොනු සඳහා විවිධ ක්‍රියාකාරකම් කිරීමට සිදු වේ.

ගොනු කැපීම හා ඇලවීම

ගොනුවල නම වෙනස් කිරීම

ගොනු මැකීම

මකන ලද ගොනු නැවත ස්ථාපිත කිරීම

03. 1. Function – Sum , Cell 1- B2, Cell2 – E2

2. =Avarage(B2 :E2)

3. සූත්‍ර පිටපත් කිරීම සඳහා පිරවුම් හැඬලය භාවිත කිරීම

(1). සූත්‍රය අඩංගු කෝෂය තෝරා ගැනීම

(2). කෝෂයේ දකුණු පස පහළ කෙළවර පිහිටි පිරවුම් හැඬලය තෝරා ගැනීම

(3). පිරවුම් හැඬලය අවශ්‍ය කෝෂය වෙත ඇදගෙන යාම

හෝ

(1). සූත්‍රය අඩංගු කෝෂය තෝරා ගැනීම

(2). Copy විධානය ලබා දීම (Ctrl + C)

(3). පිටපත් කිරීමට අවශ්‍ය කෝෂ පරාසය තෝරා ගැනීම

(4). Paste විධානය ලබා දීම (Ctrl + V)

4. ස්ථම්භ ප්‍රස්ථාර

04. Product – Product_ID
Customer – Customer_ID

II. Custormer_ID – Sales වගුවේ

III. Sales වගුවේ QTY_Sold

IV

Customer_ID	Product_ID	QTY_Sold
001	P001	2

05. 1. නිරික්ෂණ

සම්මුඛ සාකච්ජා

ප්‍රශ්නාවලි

වාර්තා හෝ ලිපි ගොනු නිරීක්‍ෂණය

මූල දර්ශ

2 මෘදුකාංග හා මෘදුකාංග නිර් හදුනාගැනිම.

අකුරු මුහුණත් දර්ශනය වන ආකාරය

දත්ත ගබඩා සැකසුම.

ප්‍රධාන දෘඩාංග පද්ධති හා ඒවයේ සංඝටක හඳුනා ගැනීම.

එක් එක් උපපද්ධති වල පරායන්ත බව හඳුනා ගැනීම පරික්‍ෂණ සැලසුම.

3 පිළිතුර අනුව ලකුණු ලබාදෙන්න.

4. මෘදුකාංග හා දෘඩාංග වෙනස්කම් සිදුවීම , ජාල වෙනස්වීම

06. 1. I . HTML වෙබ් පිටුව දර්ශනය කිරිම.

II. URL හි දැක්වෙන නමට අදාල IP ලිපිනයට පරිවර්දනය කරයි.

III. IP ලිපිනය ඇති වෙබ් සර්වරයට ඉල්ලීම යොමු කරයි.

IV. ගොනු හුවමාරුව.

2. I පරිගණකය හෝ ජංගම දුරකථනය

වෙබ් අතිරික්සුව

ISP / සේවා සපයන්නෙක්

මොඩමයක් , රවුටරයක්

II Twisted Pair / ඇඹරු කම්බි යුගල

පිළිතුර අනුව ලකුණු ලබාදෙන්න.

III ගිනි පවුර පරිගණකයට ආරක්ෂක පද්ධතියක් ලෙස ක්‍රියා කරයි. අන්තර්ජාලය සහ පරිගණක ජාලය අතර දත්ත සහ තොරතුරු සම්ප්‍රේෂණය පාලනය කිරිමට අවශ්‍ය විධිවිධාන සපයයි.

07.

1. Begin

```
x=1
   While x<100
     Display x
     x=x+2
   End while
End
```

2. A -30000

B – No

C – Yes

D -30

E – D

F – Print FS

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - i

දෙවන වාර පරීක්ෂණය - 2018

11 ශ්‍රේණිය

පිළිතුරු පත්‍රය

01	4	11	3	21	3	31	4
02	3	12	4	22	1	32	2
03	1	13	2	23	2	33	4
04	4	14	3	24	3	34	1
05	3	15	3	25	3	35	3
06	3	16	2	26	1	36	2
07	2	17	4	27	2	37	4
08	4	18	2	28	2	38	1
09	3	19	1	29	4	39	4
10	1	20	4	30	1	40	3